# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**සැලකිය යුතුයි.**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

01)**පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක** (i) **සිට** (x) **දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වන කසුන් සහ ඔහුගේ සහෝදරිය වන චමරි විසින් 2022.01.01 දින රු.150 000 බැගින් ප්‍රාග්ධනය යොදා "හරිතලතා හෙළ ඔසු" නමින් දේශීය ඖෂධ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් රජයේ ආයුර්වේද රෝහලක් අසල කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදි. **එදිනම** රු.200 000ක ණය මුදලක් දිගුකාලීනව ගෙවීමේ සහන පදනම මත ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදි. ජනවාරි මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

| | රු. |
|---|---:|
| ඖෂධ මිලදී ගැනීම සඳහා | 425 000 |
| විදුලිය වියදම් | 3 500 |
| බදු කුලී සඳහා | 6 500 |
| ඖෂධ අලෙවියෙන් ලැබූ මුදල | 475 000 |

i. (අ) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වේද?
(ආ) "හරිතලතා හෙළ ඔසු" අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසියක් ලියන්න.

ii. ඉහත සිද්ධියේ සඳහන් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලියන්න.

iii. (අ) "හරිතලතා හෙළ ඔසු" ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුද?
(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

iv. (අ) "හරිතලතා හෙළ ඔසු" ව්‍යාපාරයේ ශක්තියක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ අවස්ථාවක් ලියන්න.

v. (අ) මෙම ව්‍යාපාරය විසින් පිළියෙළ කළ යුතු මූලික පොතක් නම් කරන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ වගකීමක් සඳහා නිදසුනක් ලියන්න.

vi. 2022.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.

vii. ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යෙදීම ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

viii. ජනවාරි මස සිදුවූ බැංකු ණය මුදල ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

ix. ඉහත ව්‍යාපාරයේ ආදායම් ගිණුම්වල ඇතුළත් කළ යුතු අයිතමයක් හා වියදම් ගිණුම්වල ඇතුළත් කළ යුතු අයිතමයක් ලියන්න.

x. 2022.01.31 දිනට මෙම ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණද?

(ලකුණු 2 x 10 = 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

### ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

02)

i. (අ) ව්‍යාපාරයකින් විවිධ ප්‍රතිලාභ බලාපොරොත්තුවන පාර්ශ්ව දෙකක් ලියන්න.

(ආ) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර මිනිස් වුවමනා වේ. වර්තමාන සමාජයේ මිනිස් වුවමනා දිනෙන් දින වර්ධනය වේ.

මූලික මිනිස් අවශ්‍යතා දෙකක් නම් කර එම එක් එක් අවශ්‍යතා සපුරා ගන්නා වුවමනා දෙක බැගින් ලියන්න.

(ලකුණු 2)

ii. පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න දක්වන්න.

(අ) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම ව්‍යාපාරයේ උප අරමුණකි.

(ආ) මිනිස් අවශ්‍යතා අසීමිතය.

(ඉ) නිෂ්පාදනයේ දී අදාළ කර ගන්නා යන්ත්‍ර සූත්‍ර භූමිය සඳහා නිදසුනකි.

(ඊ) රැකියා සුරක්ෂිත බව ඇල්මැති පාර්ශවයක් වන සේවකයෝ සතු අරමුණකි.

(ලකුණු 2)

iii. කලාත්මක වේවැල් භාණ්ඩ නිෂ්පාදනයේ නියුතු "සමන් ආර්ට්" ව්‍යාපාරය භාවිතා කරන නිෂ්පාදන සම්පත් ලැයිස්තුවක් පහත දැක්වේ.

| | |
|---|---|
| මුදල් | අත්උදවුකරුවන් |
| අමු වේවැල් | අයිතිකරුගේ නිර්මාණශීලීත්වය |

(අ) මෙම සම්පත් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය යන නිෂ්පාදන සාධක යටතේ වෙන් කර දක්වන්න.

(ආ) "ව්‍යවසාය" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(ලකුණු 2)

iv. "කුමුදේශ්" ප්‍රදේශයේ කෙසෙල් ගොවීන්ගෙන් කෙසෙල් මිළ දී ගෙන තවත් සේවකයින් කිහිප දෙනෙකුගේ ද සහාය ඇතිව "Banana Juice" නමින් පානයක් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) කුමුදේශ් හැරුණු විට, මෙම ව්‍යාපාරයේ සිටින ඇල්මැති පාර්ශ්ව දෙකක් සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(ආ) ඉහත (iv) "අ" සඳහා ඔබ ඉදිරිපත් කළ එක් එක් ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු සඳහා නිදසුන එක් බැගින් දක්වන්න.

(ලකුණු 2)

(මුළු ලකුණු 8)

03)

i. (අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය යනු කවරේද?

(ආ) තාක්ෂණික වෙනස්කම් නිසා ව්‍යාපාරවල සිදුවූ වෙනස්කම්වලට නිදසුනක් දක්වන්න.

(ලකුණු 2)

ii. පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න දක්වන්න.

(අ) ව්‍යාපාර පරිසරය ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය.

(ආ) සේවකයෝ ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් සාධකයකි.

(ඉ) පුද්ගලයින් තම ආදයමින් පාරිභෝජනය සඳහා වැය නොකොට තබා ගන්නා කොටස ඉතුරුම් වේ.

(ඊ) ස්වභාවික ආපදා ව්‍යාපාරයක දුර්වලතා සඳහා නිදසුනකි.

(ලකුණු 2)

iii. රජයේ ආයුර්වේද රෝහලක හෙද නිලධාරිණියක් ලෙස කටයුතු කළ රෝහිණී රැකියාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ජනාකීර්ණ දුම්රිය පොළක් අසල ඖෂධීය පාන වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරයේ ශක්තියක් ලියන්න.

(ආ) පහත සඳහන් ප්‍රකාශයේ හිස්තැන් පුරවා නැවත ලියන්න.

ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය තුළින් එම ව්‍යාපාරයට ඇති ………….. හා ……………. හඳුනාගත හැකිය.

(ලකුණු 2)

iv.

(අ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් ලියන්න.

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් එල්ලවන අහිතකර බලපෑමක් සඳහන් කරන්න. (ලකුණු 2)

(මුළු ලකුණු 8)

04)

i. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට විවිධ ව්‍යාපාර සංවිධාන බිහිවී ඇත. මෙම ව්‍යාපාර සංවිධාන විවිධ නිර්ණායක මත වර්ග කළ හැකිය.

(අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කරන සටහන ඇඳ දක්වන්න.

(ආ) ව්‍යාපාර සංවිධානයක පරිමාණය තීරණය කිරීමේදී සලකා බලනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් ලියන්න.

(ලකුණු 2)

ii. පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න දක්වන්න.

(අ) හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වර්ග දෙකකට බෙදිය හැකිය.

(ආ) හවුල් ව්‍යාපාරවල අයිතිකරුවන්ගේ වගකීම සීමිත වේ.

(ඉ) සෑම රාජ්‍ය සංස්ථාවකම අයිතිය පූර්ණ වශයෙන් රජය සතු වේ.

(ඊ) රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරයි.

(ලකුණු 2)

iii. (අ) රාජ්‍ය සංස්ථාවක් ආරම්භ කළ හැකි දෙයාකාරය නම් කරන්න.

(ආ) රාජ්‍ය දෙපාර්තමේන්තුවල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 2)

iv. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ව්‍යාපාර ආයතන කිහිපයක් පහත දැක්වේ. එම ව්‍යාපාර ආයතන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

("අ" සඳහා පිළිතුරු ඔබ වෙනුවෙන් ඉදිරිපත් කර ඇත.)

| | ව්‍යාපාර ආයතන | ව්‍යාපාර සංවිධාන වර්ගය | හිමිකාරිත්වය/ අයිතිය |
|---|---|---|---|
| (අ) | ගගන ට්‍රේඩර්ස් | (A) ඒක පුද්ගල ව්‍යාපාර | (B) පෞද්ගලික අංශය |
| (ආ) | සීමාසහිත ලිට්රෝ ගෑස් සමාගම | (C) ………………… | (D) ………………… |
| (ඉ) | පෙරේරා සහ සහෝදරයෝ | (E) ………………… | (F) ………………… |
| (ඊ) | ලංකා විදුලිබල මණ්ඩලය | (G) ………………… | (H) ………………… |
| (උ) | ජා-ඇල විවිධ සේවා සමූපකාර සමිතිය | (I) ………………… | (J) ………………… |

(ලකුණු 2)

(මුළු ලකුණු 8)

## II කොටස - ගිණුම්කරණය
### (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05)

i. (අ) ගිණුම්කරණයේ අරමුණු දෙකක් ලියන්න.

(ආ) ව්‍යාපාරය තුළ සිදු වූ ඇතැම් සිද්ධීන් ද ගිණුම්කරණයේ ගනුදෙනු ලෙස සැලකේ. එවැනි සිද්ධිවලට නිදසුන් දෙකක් ලියන්න.

(ලකුණු 2)

ii. (අ) ජංගම වගකීම් යනු කවරේ ද?

(ආ) ව්‍යාපාරයක ආදායම් සඳහා නිදසුන් දෙකක් දක්වන්න.

(ලකුණු 2)

iii. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| | වත්කම් | අයිතිකරුගේ හිමිකම | වගකීම |
|---|---|---|---|
| (අ) | මුදල් + 800 000 | ප්‍රාග්ධනය + 800 000 | - |
| (ආ) | බඩු තොගය +20 000 | - | ණයහිමියෝ + 20 000 |
| (ඉ) | මුදල් -6000 | දුරකථන ගාස්තු - 6000 | - |
| (ඊ) | මුදල් -100 000 බඩු තොගය + 100 000 | - | - |

අවශ්‍ය වන්නේ,
ඉහත එක් එක් අවස්ථාවල දී සිදුවූ ගනුදෙනුව අගයන් සහිතව ලිවීම.

(ලකුණු 4)

iv. (අ) හිමිකම වෙනස් වන අවස්ථා දෙකක් ලියන්න.

(ආ) සුරත්ගේ ව්‍යාපාරයේ 2022 වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය (2022.01.01 දිනට) | 4 50 000 |
| වර්ෂයේ වියදම් | 2 25 000 |
| වර්ෂයේ ආදායම් | 1 50 000 |
| ජූලි 31 දින අයිතිකරු යෙදූ මුදල් | 1 25 000 |

අවශ්‍ය වන්නේ,
2022.12.31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කිරීම.

(ලකුණු 4)
(මුළු ලකුණු 12)

06)

i. (අ) මූලික සටහන් පොත්වල ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ආ) මූලාශ්‍ර ලේඛනවල අන්තර්ගත කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 2)

ii. මුදල් පොතේ ද්විත්ව කාර්යය දක්වන්න. (ලකුණු 2)

iii. පහත දැක්වෙන්නේ වෙළඳ ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයකි.

A- අයිතිකරු රු.100 000ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.

B- රු.30 000ක බඩු තොගයක් ණයට ගැනීම.

C- රු.50 000ක බැංකු ණය මුදලක් ලබා ගැනීම.

D- රු.80 000ක බඩු තොගයක් ණයට විකිණීම.

**අවශ්‍ය වන්නේ**

ඉහත එක් එක් ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා එම ගනුදෙනුවට අදාළ මූලික සටහන් පොත දක්වන්න.

(පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.)

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | මූලික සටහන් පොත |
|---|---|---|
| A | ……………………………….. | ……………………………….. |
| B | ……………………………….. | ……………………………….. |
| C | ……………………………….. | ……………………………….. |
| D | ……………………………….. | ……………………………….. |

(ලකුණු 4)

iv. පහත දැක්වෙන්නේ ධනුකගේ ව්‍යාපාරයේ 2022 ජනවාරි මාසයේ මුදල් ගනුදෙනුය.

| දිනය | ලදුපත් අංකය | වවුචර් අංකය | විස්තරය |
|---|---|---|---|
| 2022.01.01 | 01 | - | රු.75 000ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කිරීම. |
| 2022.01.02 | | 01 | රු.25 000ක වෙළඳ භාණ්ඩ මිලදී ගැනීම. |
| 2022.01.04 | 02 | | රු.20 000ක වෙළඳ භාණ්ඩ විකිණීම. |
| 2022.01.06 | | 02 | රු.30 000ක ගොඩනැගිලි කුලී ගෙවීම. |
| 2022.01.08 | 03 | | රු.10 000ක කොමිස් ආදයම් ලැබීම. |
| 2022.01.13 | 04 | | රු.50 000ක බැංකු ණයක් ලබා ගැනීම. |
| 2022.01.15 | | 03 | ව්‍යාපාර භාවිතයට රු.8 000ක උපකරණ මිලට ගැනීම. |
| 2022.01.25 | | 04 | රු.5 000ක බැංකු ණය වාරිකය ගෙවීම. |

**අවශ්‍ය වන්නේ,**

ඉහත ගනුදෙනු ධනුකගේ ව්‍යාපාරයේ මුදල් පොතේ සටහන් කර 2022.01.31 දිනට මුදල් පොත තුලනය කිරීම.

(ලකුණු 4)

(මුළු ලකුණු 12)

07)

i. (අ) "වට්ටම්" යනු කවරේ ද?
(ආ) මුදල් වට්ටම් වර්ග දෙක කවරේද?

(ලකුණු 2)

ii. (අ) මිළදී ගත් භාණ්ඩයක ලකුණු කළ මිල රු.60 000කි. භාණ්ඩය සඳහා අඩු කරන වෙළඳ වට්ටම 15% කි. වෙළඳ වට්ටම අඩු කළ පසු ගෙවූ ශුද්ධ වටිනාකම කීයද?
(ආ) ලද වට්ටම් වලට අදළ ද්විත්ව සටහන ලියන්න.

(ලකුණු 2)

iii. ලිවේරාගේ ව්‍යාපාරයේ 2022 පෙබරවාරි මාසයට අදළ සුළු මුදල් භාරකරු විසින් පහත තොරතුරු ඉදරිපත් කර ඇත.
සුළු මුදල් අග්‍රිමය රු.3 000
2022 ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම්වල එකතුව රු.2 600 කි.
2022.02.01 දිනට සුළු මුදල් ප්‍රතිපූරණය සිදුවිය.
2022 පෙබරවාරි මස සුළු මුදල් ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිනය | වවුචර් අංකය | විස්තරය | රු. |
|---|---|---|---|
| 2022.02.02 | 01 | ගමන් ගාස්තු | 150 |
| 2022.02.06 | 02 | දුමින්දට වැටුප් අත්තිකාරම් ගෙව්වා | 600 |
| 2022.02.10 | 03 | පිරිසිදු කිරීමේ කුලී | 200 |
| 2022.02.14 | 04 | පෑන් හා පැන්සල් ගත්තා | 180 |
| 2022.02.18 | 05 | සිසිල් බීම ගත්තා | 300 |
| 2022.02.23 | 06 | A4 කඩදසි ගත්තා | 250 |
| 2022.02.25 | 07 | බස් කුලී ගෙව්වා | 80 |
| 2022.02.28 | 08 | කේක් මිළට ගත්තා | 280 |

**අවශ්‍ය වන්නේ,**

(අ) ගමන්, සංග්‍රහ, ලිපිද්‍රව්‍ය, විවිධ වියදම් හා අනෙකුත් ලෙජර් ගිණුම් යන විශ්ලේෂණ තීරු සහිතව සුළු මුදල් පොත පිළියෙල කර අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම.

(ලකුණු 4)

(ආ) විශ්ලේෂණ තීරුවල එකතුව ලෙජරයට පිටපත් කිරීම.

(ලකුණු 4)

(මුළු ලකුණු 12)